# පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය
# சுற்றாடல் மற்றும் வனஜீவராசிகள் வளங்கள் அமைச்சு
# Ministry of Environment and Wildlife Resources

පරිසර අංශය சுற்றாடல் பிரிவு Environment Division

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச", இல. 416/சீ/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary: +94-11-2034121
ෆැක්ස් / தொலை நகல் / Fax: +94-11-2879944


මගේ අංකය / எனது இல / My No: MMDE/06/LR/Mineral License
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.01.03

**පරිසර චක්‍රලේඛ 01/2020**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරුන්
සහ ප්‍රාදේශීය ලේකම්වරු

**වලංගු කැණීම් බලපත්‍රයක් නොමැතිව වැලි, පස්, බොරළු කැණීම**

නීත්‍යානුකූල බලපත්‍ර ලබාගැනීමකින් තොරව සිදුකරනු ලබන වැලි, පස් හා බොරළු කැණීම මෙන්ම ලබාගත් බලපත්‍ර අවභාවිතය හේතුවෙන් පාරිසරික ගැටළු මෙන්ම සමාජීය ගැටළු රාශියක්ද මතුව තිබේ. මෙවැනි ක්‍රියා හේතුවෙන් මහා පරිමාණ පරිසර හානි සිදුවන බවට මෑතකදී දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් වාර්තා වී ඇත. ඒ අනුව, එවැනි ක්‍රියාවන් නිසා සිදුවන පරිසර හානිය අවම කිරීම මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ පරමාර්ථය වේ.

1. 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වැනි වගන්තිය යටතේ වැලි, පස් හෝ බොරළු කැණීමක් සිදුකරන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් එම පනත යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් වලංගු කැණීම් බලපත්‍රයක් ලබාගත යුතුවේ. එසේ වලංගු බලපත්‍රයක් නොමැතිව සිදුකරනු ලබන සියළු කැණීම් නීති විරෝධී වේ.

2. වලංගු බලපත්‍රයක් නොමැතිව වැලි, පස් හෝ බොරළු කැණීම් සිදු කිරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බැවින් ඔබ දිස්ත්‍රික්කයේ/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ/ ග්‍රාම නිලධාරී වසමේ ඕනෑම ස්ථානයක/ රජයේ ඉඩමක, අනවසර කැණීම් සිදුවන්නේනම් හෝ බලපත්‍රය අවභාවිත වීම සිදුවන්නේනම් එවැනි ක්‍රියාවන් මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගත යුතු වේ. එසේ වන්නේනම් ඒ පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය දැනුවත් කිරීමටත් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ එක් එක් බල ප්‍රදේශවල පොලිස් ස්ථාන දැනුවත් කිරීමටත් අක්‍රමිකතා වැළැක්වීම සඳහා සියලුම පොලිස් ස්ථානවල සහයෝගය ලබාගැනීමටත් කටයුතු කළ යුතු වේ.

මෙම චක්‍රලේඛය ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාව ඇතුව නිකුත් කරන ලද්දකි.

**ජේ. එම්. සී. ජයන්ති විජේතුංග**
**ලේකම්**
**පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය**

පිටපත්

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කාරු. දැ. ගැ. ස. |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කාරු. දැ. ගැ. ස. |
| 3. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 4. | සෙසු සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 5. | විගණකාධිපති | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 6. | පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 7. | සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 8. | සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 9. | අධ්‍යක්ෂ, වයඹ පළාත් පරිසර අධිකාරිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |